නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி செத்சிரிபாய பத்தரமுல்ல
4 floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/SA/02/01

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2015.03.04

දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරුවන් / ප්‍රජා මූල බැංකු කළමනාකරුවන් වෙත.

## ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින්, දිරියමාතා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන - 2015

**1. හැඳින්වීම.**

2015 මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින්, දිවිනැගුම ප්‍රජා මූල බැංකු හරහා දිරියමාතා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කරනු ලබයි.

අපගේ කාන්තාව / ගෘහණිය ගෘහ පාලනය හරහා සකසුරුවමට මුල්තැන ලබාදෙන අතර, එම ආදර්ශය තවදුරටත් පෝෂණය කරමින් ඉතුරුම් තැන්පතු අංශයෙන් ඇයව නව පරිචයකට යොමුකර, ඔවුන්ගේ ආර්ථික තත්වය තිරසාර කිරීමටත්, එහි ආර්ථික ප්‍රතිලාභ රටක සංවර්ධනයට යොමු කිරීමට දිරියමාතා ගිණුම් සඳහා තැන්පතු රැස්කිරීමටත්, නව ගිණුම් ආරම්භ කිරීමට යොමු කිරීම මෙම ප්‍රවර්ධන වැඩසටහනින් අපේක්ෂා කෙරේ.

මෙම ඉතුරුම් වැඩසටහන, නව රජයේ දින 100 දීප ව්‍යාප්ත වැඩසටහනට නව අරුතක් ලබාදීම තවදුරටත් අපේක්ෂා කෙරේ.

**2. අපේක්ෂිත ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන**

2.1. දීප ව්‍යාප්ත දිවිනැගුම ප්‍රජා මූල බැංකු 1074 පුරා ඉතුරුම් වැඩසටහන දියත් කළ යුතුය. මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන දිරියමාතා ඉතුරුම් තැන්පතු ගිණුම් සඳහා පමණක් තැන්පතු රැස්කරන අතර, එමඟින් රු. මිලියන 200 ක තැන්පතු රැස්කිරීමට අපේක්ෂිතය.

2.2. සමස්ථ ඉලක්කය දිවිනැගුම ප්‍රජා මූල බැංකු අතර සමානුපාතිකව බෙදී යන අතර, එක් දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක් අවම වශයෙන් රු. 200,000/- ක අවම තැන්පතු මුදලක් රැස් කිරීම අපේක්ෂා කෙරේ.

2.3. දීප ව්‍යාප්තව දිරියමාතා ඉතුරුම් ගිණුම් 25000 අළුතින් ආරම්භ කිරීමට ඉලක්ක කරන අතර, නව සහනාධාර ලැබීමට සුදුසුකම් ලබන පවුල් වල කාන්තාවන් ඇතුළු සියළුම කාන්තාවන් ඉලක්ක කර මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කල යුතුය. මෙහි දී එක් එක් දිවිනැගුම ප්‍රජා මූල බැංකුවක අළුතින් දිරියමාතා ගිණුම් 25 ක් ආරම්භ කිරීම අපේක්ෂා කෙරේ.

2.4. දිවිනැගුම ප්‍රජා මූල බැංකු වල අක්‍රීය ගිණුම් ලෙස හඳුනාගෙන ඇති සියළුම දිරියමාතා ගිණුම් නැවත සක්‍රීය ගිණුම් බවට පත් කිරීම.

2.5. ජාතික ඉලක්ක සපුරා ගැනීමට එක් එක් දිවිනැගුම ප්‍රජා මූල බැංකු සඳහා ඉලක්ක දී ඇති අතර, එම ඉලක්ක සාර්ථකව සපුරා ගැනීමට බැංකු බල ප්‍රදේශයට අයත් සියලුම වසම් අතරේ ඉලක්ක ලබා දිය යුතුය.

2.6. දිවිනැගුම ප්‍රජා මූල බැංකු වල ඉලක්ක, එකතු කර දිවිනැගුම ප්‍රජා මූල සමිතියේ ඉලක්කය සකස් කර ගත යුතුය.



| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைமடல்/Fax: | 011-2889002 | | 011-2873996 | |
| ඊ-මේල්/ மின்னஞ்சல்/E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |

**3. ප්‍රවර්ධන වැඩසටහනෙහි කාල සීමාව**

2015 මාර්තු 08 දින සිට 15 දක්වා කාලය පුරාවට ප්‍රවර්ධන වැඩසටහන දියත් කර ඉලක්ක සපුරා ගත යුතුය.

**4. ප්‍රචාරණ වැඩසටහන හා සමරු සටහනක් ලබාදීම**

4.1. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් හා ප්‍රජා සංවිධාන නායකයින් හරහා සිදුකල යුතුය. තවදුරටත් දැනුවත් කිරීමට අපේක්ෂා කරන බැංකු සඳහා අත්පත්‍රිකාවක් මුද්‍රණය කර බෙදාහැරීමට ඉඩදෙනු ලැබේ. ඒ සඳහා දිවිනැගුම ප්‍රජා මූල බැංකුවකින් රු. 1000 උපරිම මුදලක් වියදම් කර, වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන ගිණුමට හර කර සටහන් තැබිය යුතුය.

4.2. ප්‍රචාරණ අත් පත්‍රිකාව සියලුම බැංකු වෙනුවෙන් මුද්‍රණය කිරීම සම්බන්ධීකරණය දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය සිදුකල යුතුය.

4.3. මෙම ඉතුරුම් වැඩසටහන යටතේ දැනටමත් පවතින දිරියමාතා ඉතුරුම් ගිණුමකට හෝ නව දිරියමාතා ගිණුමක් ආරම්භ කරන අවස්ථාවක එකවර රු. 1000 ක් හෝ ඊට වැඩියෙන් ඉතුරුම් කරන ගිණුම් හිමියන්ට සිහිවටන සමරුවක් ලබාදීමට හැක. සිහිවටන සමරු වෙනුවෙන් උපරිම රු. 10,000/- ක මුදලක් බැංකු අරමුදලින් වැය කිරීමට අවසර ඇත.

4.4. සමරු සිහිවටනය තෝරාගැනීම හා මිලදී ගැනීම මූල්‍ය විනිවිදභාවය රැකෙන පරිදි සිදුකල යුතුය. මෙම සමරු සටහන තෝරා ගැනීමේ දී බැංකුවට ප්‍රචාරණ සහයෝගයක් හා කීර්තිනාමයක් අත්පත් කර ගැනීමට හැකිවන පරිදි සිදු කල යුතුය.

**5. දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති වල කාර්යභාරය**

දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති මඟින්, තම බල ප්‍රදේශයට අයත් බැංකු වල ක්‍රියාත්මක මෙම ප්‍රවර්ධන වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම හා සහයෝගය ලබාදිය යුතුය

**6. ප්‍රගති වාර්තා ලබාදීම.**

6.1. ඇමුණුම 01 හි සඳහන් ආකෘතිය නිසිලෙස සම්පූර්ණ කර ප්‍රගතිය 2015/03/20 ට පෙර ප්‍රජා මූල සමිතියට ලබාදිය යුතුය.

6.2. දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති විසින් බැංකු වලින් ලබාගත් ප්‍රගතිය 2015/03/27 ට පෙර ඇමුණුම් - 02 හි සඳහන් පරිදි සකස් කර දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත යොමු කල යුතුය.

6.3. දිස්ත්‍රික් දිවිනැගුම අංශය විසින් 2015/04/05 ට පෙර සියලුම ප්‍රජා මූල බැංකු වල ප්‍රගතිය සකස් කර දිවිනැගුම ප්‍රජා මූල බැංකු අංශයට කඩිනමින් ලබාදිය යුතුය.

**සුනන්දා පියසීලි,**
**අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය),**
**අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.**

**පිටපත් :-**

1. ගරු අමාත්‍යතුමා - නිවාස හා සමෘද්ධි කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. ලේකම් - නිවාස හා සමෘද්ධි කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව- කා.දැ.ගැ.ස.
4. සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් - දැ.ස. හා අ.ක.ස.
5. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - අ.ක.ස.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස.